# 26

# ඉස්ලාමීය මූල්‍යකරණය

29 (النساء)　　يَا أَيُّهَا الَّذِينَ آمَنُوا لَا تَأْكُلُوا أَمْوَالَكُمْ بَيْنَكُمْ بِالْبَاطِلِ

**" විස්වාසවන්තයිනි! නුඹලාගේ අන්‍යෝන්‍ය එකඟත්වය ඇති ව ව්‍යාපාරයෙන් මිස නීතිවිරෝධි මාර්ගවලින් එකිනෙකාගේ දේපළ නුඹලා ගිල නොගනු..."**
**(4 අන්නිසා :29)**

මිනිසාගේ දෛනික වුවමනා නිසි ලෙස ඉටු කිරීමට ආර්ථිකය ඉතා වැදගත් වේ. ආර්ථිකය පදනම් වූ විවිධ තරඟකාරී තත්ත්ව හා ගැටුම් මිනිසුන් අතර ඉතිහාසය පුරා ම ඇති වූ බව අපහට දැක ගත හැක. වත්මන් ලොව තුළ ද මේ සඳහා නිදසුන් රාශියක් ඇත.

මිනිසාගේ ධනෝපායන ක්‍රියාකාරකම්වල දී මූල්‍ය ඉතා වැදගත් ය. එම නිසා ඊට සම්බන්ධ විවිධ විධිවිධාන හා ක්‍රියාකාරකම් මිනිසා සැලසුම් කර ක්‍රියාත්මක කරයි. මෙවැනි ක්‍රියාකාරකම් අතර ඉස්ලාමයේ මගපෙන්වීම් සමඟ එකඟ වන කරුණු ද ඇත. ඒලෙස ම එකඟ නො වන කරුණු ද බොහෝ ඇත. ඒවා දැනගෙන මුස්ලිම්වරුන් කටයුතු කිරීම අවශ්‍ය වේ.

ඉස්ලාම් දහමේ මග පෙන්වීමට අනුව ධනය නිවැරදි මාර්ගයකින් ඉපැයීම හා යහපත් මගෙහි වියදම් කිරීම උසස් නැමදීම්වලින් එකකි.

මේ ගැන අල් කුර්ආනය "නුඹලාගේ කිසිවකු අන් අයගේ භාණ්ඩ අයථා ක්‍රමවලින් පරිහරණය නොකරනු." යන්නෙන් අවවාද කරයි. (04 අන් නිසා :29)

"යම් පුද්ගලයකු තවත් කෙනකුගෙන් සිඟමන් නොයැද සිටීම සඳහා ද ඔහුගේ පවුල වෙනුවෙන් ඉපයීම සඳහා ද අසල්වැසියන්ට සැලකීමට ද අනුමත කරන ලද (හලාල්) භාණ්ඩ සොයා උපයන්නේ ද, කියාමා දිනයේ ඔහු පසළොස්වක සඳ මෙන් බැබළෙන මුහුණකින් යුතු ව අල්ලාහ් හමුවන්නේ ය." යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පැවසුවේ ය. (අත් තබරානි)

එම නිසා නිරත විය හැකි හා නොහැකි ගනු දෙනු පිළිබඳ සෑම මුස්ලිම්වරයකු ම දැන සිටිය යුතු ය. එනම් මූල්‍ය කටයුතුවල දී හලාල්, හරාම් පිළිබඳ දැනුම ඇති පුද්ගලයින් ලෙස මුඃමින්වරු සිටිය යුතු බව ඉස්ලාම් දහම අපේක්ෂා කරන බැවින් මූල්‍ය කටයුතු පිළිබඳ ඉස්ලාම් දහමේ මග පෙන්වීම් අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. උමර් රළියල්ලාහු අන්හු තුමාගේ පහත දැක්වෙන වැකි එය තව දුරටත් තහවුරු කරයි. "ආගමික නීති රීති දන්නා අය පමණක් අපගේ වෙළඳ පොළ ගනු දෙනු කටයුතුවල නිරත වන්න, නොඑසේ නම් වෙළඳ පොළට එන්න එපා," යනුවෙන් ඔහු පැවැසුවේ ය.

**ධනෝපායන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත දක්වා ඇති පරිදි ඉස්ලාම් දහමේ මූලික කරුණු කෙටියෙන් විමසමු.**

- මුස්ලිම්වරයකු නිතර ම හලාල් මාර්ගයෙන් ඉපැයීය යුතු ය.
- අවංක වෙළෙන්දාහට අල්ලාගේ දයාව ලැබේ.
- අවශ්‍යතා ඇත්තවුන්ට ණය දීම ද, ණය නැවත පියවීමට උදව් කිරීම ද මුඃමින්වරුගේ ගුණාංග වේ.
- මූල්‍ය ක්‍රියාකාරකම්වල දී උකස් හා බදු දීම වැනි ක්‍රියාදමයන් අනුගමනය කරන්නේ ය.
- ඉපැයිමේ දී (රැකියා කිරිමේ දී) සාමූහික ප්‍රයත්නය ඉස්ලාමය අනුමත කර අවශ්‍ය මගපෙන්වීම ලබා දී ඇත.
- පොළිය, අප මිශ්‍රණය, සූදු කෙළීම, රැවටීම යනාදිය අනෙකාගේ ධනය අනවසරයෙන් භුක්ති විඳිනා නොමනා ක්‍රියා වේ.

අයුතු ක්‍රියාමාර්ග තුළින් ඉපැයීම තහනම් කර ඇති ඉස්ලාම් දහම අවංක භාවයෙන් සාධාරණ ව උපයන විවිධ ක්‍රියා මාර්ග අනුමත කොට ඇත. මිනිසා හලාල් මාර්ගයෙන් උපයා ජීවත්වීම ගෞරවණීය මෙන් ම ඔහුගේ යුතුකම ද වේ, යන්න මෙහි දී අවධාරණය වේ.

## ඉස්ලාමය පිළිගන්නා ව්‍යාපාර ක්‍රම කිහිපයක් ගැන බලමු.

### 1. අල් මුරාබහා

මෙහි දී යම් කිසි භාණ්ඩයක් ගත් මිලට වෙළෙඳ පොළේ මිල අනුව ලාභය ද එකතු කර විකුණනු ලැබේ. මෙහි දී පාරිභෝගිකයාට හා වෙළෙන්දාට මිල කේවල් කිරීමේ අවස්ථාව ඇති අතර මිල කිසි ම වෙනසක් නොමැති ව ස්ථිර අගයකට භාණ්ඩය අලෙවි කිරීමේ අයිතිවාසිකම ද වෙළෙන්දට ඇත. භාණ්ඩයේ වටිනාකම එක් වතාවකින් හෝ වාර කිහිපයකින් ලබා ගත හැක. වාරික ලෙස අයකර ගැනීමේ දී ලාභය වැඩිකිරීමේ අයිතිය ද වෙළෙන්දට හිමි ය.

### 2. අල් මුළාරබා

මෙම ව්‍යාපාර ක්‍රමයේ දී ප්‍රාග්ධනය ඇති මූල්‍ය කටයුතු පිළිබඳ අත්දැකීම් නොමැති අය මෙන් ම අත්දැකීම් ලත් ප්‍රාග්ධනය නොමැති අයට ද ඵල නෙළා ගැනීමට අවස්ථාව උදා වේ. ප්‍රාග්ධනය ඇත්තා ප්‍රාග්ධනය යොදවන අතර ව්‍යවසායකයා තම දැනුම හා අත්දැකීම් භාවිත කර උපරිම ඵල ලබා ගැනීමට තැත් කරයි. ප්‍රාග්ධනය පිළිබඳ දෙදෙනා අතර අන්‍යෝන්‍ය අවබෝධයක් තිබිය යුතු යි. ලාභය දෙපාර්ශ්වය අතර ම බෙදී යන අතර අලාභය ව්‍යවසායකයාගේ අපරීක්ෂාකාරී බව නිසා සිදු නොවුණා නම් ප්‍රාග්ධනය යෙදවූ පාර්ශ්වය පමණක් එහි වගකීම ගනී.

### 3. අල් මුෂාරකා (හවුල් ව්‍යාපාර)

මෙය එකකට වැඩිය හවුල් කරුවන් එකතු වී මෙහෙයවන ව්‍යාපාර ක්‍රමයකි. මෙහි

පාර්ශ්වකරුවන් වන ව්‍යවසායකයන් ප්‍රාග්ධනය හා මානව සම්පත් තම තමන්ගේ ධාරිතාව අනුව යොදවනු ඇත. ලාභය අවබෝධතාව මත බෙදා දීම සිදු වේ. ඒ අතර තම තමන් එම ව්‍යාපාරයේ අයත් කොටසේ ප්‍රමාණය අනුව අලාභයේ වගකීම බෙදී යැයි.

විවිධ අය අතර බෙදී යන සම්පත් හා හැකියාවන් එක් වන තැන ලාභ ලබන ව්‍යාපාරයක් බිහිවීමේ ඉඩකඩ බහුල ය. හවුල් ව්‍යාපාරයක දී විවිධ ධනය හා හැකියාවන් එක් වී ව්‍යාපාරික කටයුතු සිදු වේ. සමාජයේ විවිධ අවශ්‍යතා ඉටු වේ. හවුල් ව්‍යවසායකත්වය ඉපැයීම, දියුණු වීමට ඇති සාර්ථක මගකි. අවංක හවුල් ව්‍යාපාර දිරිමත් කිරීම සඳහා හදීස් කුද්සි සඳහන් " කෙනෙකු තවත් කෙනෙකුට ද්‍රෝහිකම් නොකර හවුල් ව්‍යාපාරයක නියලෙන සෑම කල්හි මම තෙවැන්නා (තුන්වැනියා) ලෙස සිටිමි." (අබූදාවූද්) යන්නේන් සඳහන් වේ.

මේ හැර ඉජාරා (බදුකුලියට ගැනීම) සලම් (කෘෂිකර්ම ණය) ඉස්තිස්නාඋ (නිෂ්පාදන ණය) උකස්, පරෝපකාරී ණය යනාදී මූල්‍ය හා සබැඳි ක්‍රියා විවිධ ඉස්ලාමික මූල්‍ය ප්‍රතිපත්ති කොන්දේසි ලෙස දී ඇතුළත් කර ඇත. ඒවා නිසි ලෙස අනුගමනය කර ඉපැයීමේ කටයුතුවල නිරත වීම ඉස්ලාමය අනුමත කර ඇත.

ඒවායේ හරාම් වන (නීතිවිරෝධි) මගවන පොළිය, සූදුකෙළීම, රැවටීම, අපමිශ්‍රණය කිරීම. කිරුම් මිනුම්වල වංචා කිරීම. හිංසා ඇති කරන දේ නිෂ්පාදනය කිරීම පිළිගැනිම හා විකිණීම හෝ ඊට සහයෝග දීම වැනි බොහෝ කරුණු ඉස්ලාමිය මූල්‍යය ප්‍රතිපත්තිවල මුළුමනින් ම තහනම් කර ඇත.

## පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❁ المُرابَحَةُ ❁ المُضَارَبَةُ ❁ المُشَارَكَةُ ❁ الإجَارَةُ ❁ السَّلَمُ ❁ الاسْتِصْنَاعُ

## අභ්‍යාසය

1. 'ඉස්ලාම් දහම හවුල් ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරයි' යන්න සාක්ෂි සඳහන් කරන්න.
2. ඉස්ලාමිය මූල්‍ය ක්‍රියාකාරකම් අතරින් 'මූලාරබාහි සුවිශේෂත්වය පිළිබඳ අදහස් දක්වන්න.
3. අනෙක් මූල්‍යමය ක්‍රියාකාරකම් ඉස්ලාමිය මූල්‍ය ක්‍රියාකාරකම් වෙනස් වන අයුරු ඔබ අධ්‍යයනය කළ පසුබිම ඇසුරෙන් විස්තර කරන්න.
4. ඔබ ඉගෙන ගත් විවිධ වෙළෙඳාම් ක්‍රම අර්ථකථනය කරන්න.